# පත්තර මහගෙදරින් බිහි වී
# පත්තර ලෝකය දිග්විජය කළ තලංගම



පැ ‍නෙන් තෙලි තුඩෙන් ජනතාවගේ පැත්තේ සිට සටන් කළ ප්‍රවීණ කාටූන් ශිල්පී, චිත්‍ර ශිල්පී සහ කවියකුද වන තලංගම ජයසිංහ මහතා ඊයේ (08දා) අභාවප්‍රාප්ත විය. ඔහු මෙරට පුවත්පත් කලාව තුළ නොමැකෙන නමක් තැබූ විශිෂ්ටයෙකි. ඔහු විශිෂ්ටයකු බවට පත් වන්නේ පුවත්පත් කලාව තුළ විවිධ අංශ ඔස්සේ සිය දක්ෂතා දැක්වීම නිසාය. ඔහු වරෙක කවියකු ලෙස ද තවත් විටෙක චිත්‍ර ශිල්පියකු ලෙසද සිය නිසඟ හැකියාව දැක්වූයේය. තලංගම ජයසිංහ මහතා කාටූන් ශිල්පියකු ලෙස පුවත්පත් කලාව තුළ දැක්වූ දක්ෂතා විශේෂ වූයේ ඕනෑම දේශපාලනඥයකු හෝ ඉහළ නිලතල දරන්නෙකු වුවද විවේචනය කිරීමට තරම් පසුබට නොවීමය. මෑත කාලීනව තලංගම ජයසිංහ මහතාගේ ජනප්‍රිය කාටූන් රැසක් සහ කවියක් ද පළ වූ අතර ඉන් ඔහු අපහාසය වෙනුවට උපහාසාත්මක ලෙස තම නිර්මාණශීලී හැකියාව ගෙන හැර දැක්වීය.

තලංගම ජයසිංහ මහතා පුවත්පත් කලාව වෙත පිවිසියේ 1950 දසකයේදීය. ඔහු තම පුවත්පත් හැකියාවන් පෙන්වීමට තෝතැන්න බවට පත් කර ගනු ලැබුවේ පත්තර මහගෙදර ලේක්හවුස් පුවත්පත්ය. පනහ දසකයේ ජනතා පුවත්පතෙන් ඔහු ආරම්භ කළ පත්තර ජීවිතය අවුරුදු හතළිහකට ආසන්න කාලයක් ගත කළේ ලේක්හවුසියේය. ඔහු හැඩ කළ පුවත්පත් අතර දිනමිණ, සිළුමිණ, ජනතා සහ තරුණි ප්‍රමුඛය. ලේක්හවුස් ආයතනය ආරම්භ කළ මධුර පුවත්පත තලංගම ජයසිංහයන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කළ පුවත්පතයි. එකල මෙරට පළ වූ ජනප්‍රියම චිත්‍ර කතා පුවත්පත බවට පත්ව තිබුණේ ද මධුර පුවත්පතයි.

1954 දී කොට කලිසමකින් සහ ෂර්ටයකින් සැරසී ලේක්හවුස් පඩි පෙළ නැඟ ආ තලංගම මහතා එදා ලේක්හවුස් මන්දිරයේ දිනමිණ කන්තෝරුවට පැමිණ තිබුණේ එවකට දිනමිණ පුවත්පතේ කර්තෘ වූ පියසේන නිශ්ශංක මහතා හමුවීමටය. නිශ්ශංක මහතා තලංගම ජයවිලාල් විලේගොඩ මහතා වෙතට යොමු කළ අතර එහිදී විලේගොඩ මහතා සඳහන් කර ඇත්තේ " ෂා මේක අපි පත්තරේ පළ කරමු" කියාය. දිනමිණ පුවත්පතේ පළමු චිත්‍ර කතාව වූ "විත්‍රා" පාඨකයන් වෙත පැමිණියේ එලෙසිනි. 1954 දී ශිෂ්‍යකු ලෙස ලේක්හවුස් පඩි පෙළ නැඟ ආ තලංගම ජයසිංහ මහතා ලේක්හවුස් චිත්‍ර ශිල්පියකු ලෙස එහි සේවයට එක් වන්නේ 1957 වර්ෂයේදීය. එසේ ජාතික තලයට පැමිණි ඔහු 1957 වර්ෂයේ සිට තම ජීවිතයේ අවසානය දක්වාම සිය තෙලි තුඩ මෙන්ම පෑන ද



පිරිසක් අතරින් තෝරා ගත් පළමුවැන්නා වෙමිනි. උප්පැන්න සහතිකයේ ජෝර්ජ් එඩ්මන්ඩ් ජයසිංහ ලෙස සඳහන් වුවද ඔහුව ඒ නමින් දන්නෝ සිටින්නේ ස්වල්පයකි. තලංගම ජයසිංහ කියූ විට වැඩිහිටියාගේ සිට කුඩා ළමයා දක්වා බොහෝ දෙනකු ඔහු හඳුනති.

සිළුමිණ පුවත්පතේ ඔහු සිතුවම් කළ " සුනඛ සංදේශය " නැමැති විශේෂාංගය පැරැණි සංදේශ කාව්‍ය ආකාරයට රචනා වූවකි. කොළඹ කොටුවෙන් ගමන් අරඹන සුනඛයා සතියෙන් සතිය එක් එක් තැන් බලා ගමන් කරයි.

මිනිස් දඩයම ද ඔහුගේ ජනප්‍රිය අංගයකි. මෙරට ජනප්‍රිය ලේක්හවුස් පුවත්පත් රැසක පිට කවර නිර්මාණය කළ " තරුණි " පුවත්පතේ චිත්‍ර ශිල්පියකු සහ මුල් කවර නිර්මාණකරුවකු ලෙස ද කටයුතු කළේය.

ලේක්හවුස් ආයතනයේ සේවය කරන අතර පොත් පිට කවර ඇතුළු සිතුවම් කලාවට ඔහු ලබා දුන් දායකත්වය අප්‍රමාණය.

නුවර " ඩෙංකුට්ටු "නමින් තලංගම ප්‍රේමරත්න ලියූ පොත සඳහා චිත්‍ර අඳින ලද්දේද තලංගම මහතා විසිනි. මෙම පොත එකල දැඩි ලෙස සමාජ අවධානයට ලක් වූ පොතක් ලෙස සඳහන් කළ යුතුය.

අකුරු ඇමිණූ කාලයේ සිට නව ඩිජිටල් කාලය දක්වා නිසි ආකාරයෙන් පරිණාමය වීමට තලංගම ජයසිංහ මහතා වෙත ඉහළ හැකියාවක් තිබුණි. වයස අසූ අටක් වුවද ඔහු කටයුතු කළේ තරුණයකු ලෙසය. ඔහුගේ අදහස් ද තරුණය. දේශපාලනය රැඩිකල්ය. මෑත කාලයේදී වඩාත් ප්‍රහාරාත්මක ශෛලියකින් තම කාටූන් සහ කවි කළ ඔහුට දේශපාලනය තුළ යම් කිසි අදහසක් තිබුණ ද ඒ කිසිවක් පුද්ගලික ජීවිතයට සම්බන්ධ කර ගත්තේ නැත. මෑත යුගයේ ජාතික පුවත්පතක පළ වූ "ඒ තුමා, පලා මල්ලූ, සහ අනේද කියන්නේ " වැනි කවි පුවත්පත් පාඨකයන් අතර පමණක් නොව පුංචි තිරයෙන් පත්තර බලන පිරිස් අතර ද මහත් ජනප්‍රියත්වයට පත්ව තිබුණි. පත්තරකාරයකු ලෙස රටම දැන ගත් තලංගම මහතා සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයකු බවට ද පසුකාලීනව පත්විය. ඔහු සිය මුහුණුපොත තුළ අපූරු කවි සහ අදහස් පළ කළේය. මේ පසුගිය දවසක තලංගම ජයසිංහ මහතාගේ ෆේස්බුක් භිත්තියේ තැබූ කවි සටහනකි.

දණ ඇන වඳින විට අසරණ ඇතකු හට
හුරු කොට පෙරහරේ ගොස් උඹ
මැරුණ විට
සලකන ඔහුත් බුදුවන බෝසතකු කොට
ගොන් තඩියන්ය ඉන්නේ වැඩිපුරම රට

මේ තලංගම තම රැඩිකල් අදහස් මුහුණු පොත තුළ සඳහන් කළ අයුරුය. තලංගම ජයසිංහ යනු පුවත්පත් කලාව තුළ වියපත් නොවූ පුවත්පත් කලාවේදියකු ලෙස සඳහන් කිරීම නිවැරැදිය. ඔහු මිය යන විට වයස අසූ අටක් වුව ද ඔහුගේ රුව නොදුටු බොහෝ අය සිතන්නේ තලංගම ජයසිංහ යනු මැදිවිය ඉක්මවා නොගිය කෙනකු බවය. මන්ද යත්, ඔහුගේ එදා නිර්මාණ මෙන්ම මෑත කාලීන නිර්මාණ ද ඉතාමත් ජවසම්පන්න ඒවා වීමය. ඇත්තෙන්ම තලංගම ජයසිංහ නම් වූ පත්තර මහගෙදරින් බිහි වී පත්තර ලෝකය දිග්විජය කළ ඔහු මිය ගිය ද තවත් ශත වර්ෂයක් ගත වන තුරු ඔහු ගැන මතක සහ ඔහුගේ නිර්මාණ ජීවමානව පවතිනු නිසැකය.

**උදිත ගුණවර්ධන**